**නාඋල ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නාඋල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නාඋල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාල සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 4 කදී ගෙවන ලද රු. 43,759 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි . | 2023 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ජ'ර්නල් මඟින් නිවැරදි කර ගන්නා බව. | වියදම් හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල 2023 වර්ෂයේ දී අවස්ථා 04 කදී ගෙවන ලද රු.97,689ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ජ'ර්නල් මඟින් නිවැරදි කර ගන්නා බව. | -එම- |
| (ඇ) | උඩ අස්වැද්දුම මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ බිල් වටිනාකම අනුව රු.227,968 ක් කොන්ත්‍රාත්කරුට ගෙවියයුතු වුවද එය රු.250,286 ක් ලෙස ණයහිමියන් යටතේ දැක්වීම නිසා රු.22,318 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු වියදම් හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 5 කට අදාල උප ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.1,164,020 ක නොසැසඳීම් විය. | 2023 වර්ෂයේ ගිණුම් සකස්කිරීමේදී ජ'ර්නල් සටහන් මඟින් නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළයුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තු පනත් | | | |
| (i) | 1946 අංක 30 දරන පරිපනම් හා තක්සේරු ආඥා පනතේ 20 වන වගන්තිය | 2011 වසරින් පසු සභා බල ප්‍රදේශයේ පිහිටි වරිපනම් දේපල තක්සේරුවක් සිදුකර නොතිබුණි. | නව වරිපනම් තක්සේරුවක් සිදුනොකළ අතර ඉදිරියේදී නව තක්සේරුවක් කරන බව. | පනතේ විධිවිධානයන්ට අනුව කටයුතු කළයුතුය. |
| (ii) | 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රයේ පලකරන ලද 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත 83(1) වගන්තිය | අනුකූලතා සහතික ලබා නොගෙන පදිංචිය සඳහා යොදාගත් පාර්ශවයන් 20 කගේ පදිංචි කාලය සඳහා දිනකට රු.100 බැගින් ගාස්තු අයකර නොතිබුණි. | පදිංචි වී සිටින දින සිට ගාස්තු ගෙවා අනුකූලතා සහතික ලබා ගන්නා ලෙස ලිපි මගින් දැනුවත් කර ඇති බව. | පනතේ විධිවිධානයන්ට අනුව කටයුතු කළයුතුය. |
| (ආ) | රීති | | | |
| | 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති 61 | බලපත්‍ර සමීක්ෂණක් සිදුකර එම සමීක්ෂණ වාර්තාවේ තොරතුරු අනුව පී.එස්. 26 ඒ ආකෘතියේ ලේඛනයේ සටහන් නොකර බලපත්‍ර ගාස්තු අයකරන අවස්ථාවේ බිල් කිරීම් ලේඛනගත කරන අවිධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. | සමීක්ෂණ වාර්තාවේ තොරතුරු අනුව පී.එස්.26 අකෘතියට අනුව ලේඛන ගත කිරීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය . |
| (ඇ) | චක්‍රලේඛ | | | |
| | 2014 මාර්තු 20 දිනැති අංක 2014/02 දරන මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | | | |

| | | | |
|---|---|---|---|
| 3 ඡේදය | මුළු පුනරාවර්ථන වියදමින් සියයට 50 ක් මංමාවත් ගොඩනැඟිලි හා ස්ථාවර වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව සඳහා යෙදවියයුතු බවට උපදෙස් ලබාදී තිබුණද ඒ සඳහා පුනරාවර්ථන වියදමින් සියයට 35 කට අඩු ප්‍රමාණයක් එනම් රු.9,043,500 ක් අයවැයෙන් වෙන්කර තිබුණි. | මංමාවත්,හා ගොඩනැගිලි හා ස්ථාවර වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව සඳහා සැලකිය යුතු ප්‍රතිශතයක් වෙන් කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,695,089 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,177,734 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

**සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් | 1,697,527 | 1,638,913 | 1,695,172 | 2,229,307 | 1,631,550 | 1,535,232 | 1,494,330 | 2,285,566 |
| (ii) | කුලී | 2,714,200 | 2,161,930 | 2,266,710 | 775,155 | 3,819,000 | 2,206,768 | 1,970,563 | 879,935 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,770,000 | 1,461,000 | 1,461,000 | - | 1,495,200 | 1,436,085 | 1,436,085 | - |
| (iv) | වෙනත් ආදායම් | 17,613,000 | 834,429 | 9,698,851 | 6,665,914 | 13,895,500 | 14,376,380 | 11,394,789 | 8,541,150 |
| | එකතුව | **23,794,727** | **6,096,272** | **15,121,733** | 9,670,376 | 20,841,250 | 19,554,465 | 16,295,767 | 11,706,651 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් බදු** | | |
| | ඒකකයක හිඟ හිටි වරිපනම් ශේෂය රු.5,000 ක් ඉක්ම වූ වරිපනම් ඒකක 73 කින් වසර 1 සිට වසර 5 අතර කාල පරාසයක සිට අය නොවී පැවත එන හිඟ හිටි වරිපනම් රු.677,683 ක් විය . | හිඟය අයකිරිමට කටයුතු කරන බව. | පනතට අනුව හිඟ ආදායම් අයකර ගතයුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| | සතිපොල අංක 10 කඩ කාමරය ලෙස නම්කර තිබුණු නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් පැරණි රජයේ නිවසක් රු.1,000 බැගින් මාසික කුලියක් මත 2009 මාර්තු 17 දින ගිවිසුම්ගතව සභාව විසින් භාහිර පුද්ගලයෙකුට පදිංචිය සඳහා බදු දී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවියයුතු කුලිය රු.82,840 ක් විය. | අයිතිය නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළයුතුය. |
| **(ඇ)** | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.497,980 ක් හා මුද්දර ගාස්තු රු.4,644,000 ක් විය. | මුද්දර ගාස්තු හා උසාවි දඩ වලට අදාළ උපලේඛන ආයතන වලට යොමු කර ඇති බව. | මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 3 ක එකතුව රු.1,913,467 ක් විය. | ලැබිය යුතු ගිණුම් ශේෂ ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ශේෂ අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතුව රු.16,590,626 ක් විය. | මුදල් ඉදිරියේදී ගෙවීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | 2016 පෙබරවාරි 23 දිනැති අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන ( සම්මත අතුරු | මාර්ගය වෙන්කරගැනීමේ ගැටළුපැවතීම නිසා ගැසට් කිරීම සිදු නොකල අතර ඉදිරියේදී ගැසට් කිරීමට | පනතේ විධිවිධානයන්ට අනුව කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යවස්ථා ) පනතේ ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 4(1) වගන්තියට අනුව සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබිය යුතු ස්ථාන හා එක් එක් ස්ථානයේ නවතා තැබිය යුතු උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව මත සභාව මඟින් තීරණය කර එය ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කර නොතිබුණි. | කටයුතු කරන බව. | |
| (ඇ) | මධ්‍යම වෙළඳපොල කඩ කාමර 13 ක් ගිවිසුම් ගතවීමකින් තොරව ව්‍යාපාර කටයුතු වලට ලබාදී තිබුණි. | වසංගත තත්වය හා රටතුළ පැනනැගුණු ආර්ථික අර්බුදකාරි වාතාවරණය හේතුවෙන් මෙම කඩ කාමර වසා තිබුණු බව. | විධිමත් පරිදි ගිවිසුම් ගත වීමට කටයුතු කළයුතුය. |

### 3.2 අරමුණු ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බදු ලබාගත් කඩ කාමර අදාල ව්‍යාපාර කටයුතු වලට නොයොදවා වසා තැබිය නොහැකි වුවත් බදු ලබාගත් බදුකරුවන් විසින් කඩ කාමර 4 ක් වසා දමා තිබුණි . | කඩකුලී ගෙවීම අඛණ්ඩව සිදු කරන බැවින්,එම කඩ කාමර පිළිබඳව නැවත සමීක්ෂණය කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | බදු ලබාගත් කඩ කාමර, ව්‍යාපාර කටයුතු වල යෙදවිය යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 199,000,000 ක් වූ ඉඩම් 17 ක අයිතිය පවරාගෙන නොතිබුණි. | ඔප්පු හෝ පැවරුම් නියෝග ලබා ගැනීමට අදාලව කටයුතු කර ඇති අතර, ඉදිරියේදී ලබා ගැනීමට කටයුතු කරන බව. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතුය. |

### 3.3.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.43,453,000 ක ඉඩම් හා ගොඩනැඟිලි 19 ක් වසර 1 ත් 16 ත් අතර කාලයක් නිෂ්ක්‍රීයව පැවැතුණි. | පොදු කටයුතු සඳහා අවශ්‍යතාවයන් අනුව යොදා ගැනීමට කටයුතු කරන බව. | ඉඩම් උපයෝජනය කළයුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**
**අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු ගත ආදායම හා වියදම තථ්‍ය ආදායම හා වියදම සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 11 කට අදාල ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 36 සිට සියයට 96 දක්වා ද වැය විෂයයන් 29 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් සියයට 38 සිට සියයට 99 ක් දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ අතර, වැය විෂයයන් 35 ක එකතුව රු. 85,727,500 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම වැය කිරීමකින් තොරව ඉතිරි කර තිබුණි. | ඉදිරි වර්ෂයන්හිදී ඇස්තමේන්තු ආදායම් අයකිරීමට කටයුතු කරන බව. | අවධානයෙන් හා සැලකිල්ලෙන් අවශ්‍යතාවය සලකා බලා අයවැය පිළියෙල කළයුතුය. |